දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. : ........................................

මගේ අංකය / எமது இல. / My No. : ED/04/60/02/ගුරු ඉල්ලීම්

දිනය / திகதி / Date : 2011 06.23

චක්‍රලේඛ අංක : 2011/24

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත,
පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත,

## 2000.08.04 හා 2002.01.01 යන දිනයන්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලැබූ නිලධාරීන්ගේ වැටුප් සැකසීම

අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ 2010/12 අනුව 2000 වසරින් පසුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලැබූ නිලධාරීන්ට ඔවුන්ගේ අභිමතය පරිදි යළි ගුරු සේවයට යාමට ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු වෙත දන්වා ඇත.ඒ අනුව මෙම අමාත්‍යංශය වෙත විදුහල්පතිවරු 500කට අධික ප්‍රමාණයකගේ ඉල්ලීම් ලැබුනු අතර ඒ සම්බන්ධව එකඟතාව ලබා ගැනීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා ජාතික වැටුප් කොමිෂමේ ලේකම් වෙත ලිපි යොමු කරන ලදී.

02 ඒ අනුව 2000.08.04 හා 2002.01.01 යන දිනයන්හි විදුහල්පති සේවයට පත්වීම් ලැබූ නිලධාරීන්ට පමණක් පෞද්ගලික වන සේ (හිඟ වැටුප් ගෙවීමකින් තොරව) පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කර ඔවුන්ගේ වැටුප පරිවර්තනය කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-4/ MINUT/04/2704 හා 2011.04.20 දිනැති ලිපිය මගින් හා ජාතික වැටුප් කොමිෂමේ ලේකම්ගේ අංක NS/CC/1/34/S-1 හා 2011.02.25 දිනැති ලිපි මගින් එකඟතාව ලැබී ඇත.මෙය ඉහත සඳහන් දිනයන්හි විදුහල්පති පත්වීම් ලබා දැනට විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ට ද වලංගු වන බව කාරුණිකව දන්වා සිටිමි.

ශ්‍රී ලංකා ගුරු සේවයේ සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලබන දිනට

1 ගුරු සේවයේ ලබමින් සිටි වැටුප නව වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට අඩුනම් ඔහු නව වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපෙහි තබනු ඇත.

2 ගුරු සේවයේ ලබමින් සිටි වැටුප නව වැටුප් පරිමාණයෙහි වැටුප් පියවරකට අනුරූප වේ නම් ඔහු එම වැටුප් පියවරෙහි තබනු ඇත.

3 ගුරු සේවයේ ලබමින් සිටි වැටුප නව වැටුප් පරිමාණයෙහි වැටුප් පියවරවල් අතරට අයත් නම් නව වැටුප් පරිමාණයෙහි ඉහළ වැටුප් පියවරෙහි තබනු ඇත.

4 වැටුප් වර්ධක අගය වනුයේ විදුහල්පති සේවයේ පත්වීම් ලැබූ ශ්‍රේණියට අදාළ වැටුප් වර්ධක අගයයි.

03 මෙම චක්‍රලේඛය 2011 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වේ.

එච්.එම් ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය.